දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය - 2019

13 ශ්‍රේණිය | සිංහල | විසඳුම් පත්‍රය

## I - පත්‍රය

(01) අ) i. තුනුරුවන් ගැන පැහැදීමක් ඇති බව, ශ්‍රමණ බ්‍රාහ්මණයින්ගෙන් බණ අසා තිබීම, ශරීරය අස්ථිර දෙයක් බව.

ii. මවු කුස නැමැති කුණු මස් වැදැල්ලෙහි පණුවකු මෙන් ඉපදීම, තිස් දෙකක් වූ කුණු කොටස්වලින් යුතු අස්ථිර දෙයකි ශරීරය.

iii. මේ ශරීරය නිර්මාණය වී ඇත්තේ මුතු ඇටකින්, මැණිකකින්, රත්රනින් නොවෙයි.

iv. නිල් මහනෙල්, රතු නෙලුම්, සුදු නෙලුම්, ඕලු, කුමුදු මල් ආදි පස් පියුම් (දියෙහි පිපෙන මල්)

ආ) i. පුරුෂයාට - ශාරීරික ශක්තිය
ස්ත්‍රියට - ඥානය පිළිබිඹු කරන රැවටීමේ ශක්තිය

ii. ස්වාමිපුරුෂයා වටේ තුන් වරක් කැරකී සතර පැත්තෙන් ම සිට වැඳ (සතර තැනෙක සිට වැඳ)

iii. නුවණ, ඥානය, බුද්ධිය ලැබෙන්නේ සුදුසු වේලාවට ප්‍රයෝජනයත් ගැනීමටයි. නුවන පලාගෙන මද කන දෙයක් වන්නේ නැත.

iv. සිතෙහි කලකිරීමත් සමඟ ඇති වන කනගාටුව

ඇ) i. හිසෙහි නහර වැල් පිහියකින් කැලි කපන විට දැනෙන වේදනාව හා සමාන වේදනාවක්

ii. වෛද්‍යවරුන් දෙදෙනෙක් හිස කපා පණුවන් දෙදෙනා වෙන වෙන ම දුටු අතර ජීවක වෛද්‍යවරයා පණුවන් දෙදෙනා ම එක වර දුටුවේ ය.

iii. රජගහ නුවර (බිම්බිසාර රජුගේ) ඔසවන ලද කොඩියක් ඉතා ප්‍රසිද්ධ වූ සිටුතුමා මිය ගියහොත් බිම්බිසාර රජුට විශාල හානියක් වන බව ය.

iv. මොළය කන

ඈ) i. මාතලිය, තොප මාළුවකුගේ විලාසය අරගෙන මා යන ඉදිරියට වතුරෙහි සිය ගොඩට පනින්න.

ii. සිගාලය, මස් කැටිය කටින් රැගෙන ගඟ අසළින් යන විට වතුරේ සිට ගොඩට පැන්න මාළුවා ඇල්ලීමට යාමත් සමඟ මස් කැටිය උඩ යන උකුස්සා රැගෙන යාමත්, මාළුවා යහපත් දියට පැනීමත් නිසා සිගාලයාට මසුත් මාළුත් දෙක ම නොලැබී යාම.

iii. එම හිවලා කටෙහි තිබූ මස් කැටියක් අල්ලා ගන්ට සැරසුණු මාළුවාත් දෙක ම නොලැබ කැලඹුණු සිතිවිලිවලින් යුතුව ගඟ සමීපයේ සිටියේය

iv. පංචසිඛ - කොණ්ඩ පහක් බැඳ ඇති දිව්‍ය ලෝකයේ වෙසෙන සක් දෙව් රජුගේ සංගීතඥයා (ගාන්ධර්වයා)

ඉ) i. උඩට සුදු පිරිසිදු වියන් බැඳ නිල් මහනෙල් මල් එහි එල්ලා විදුලි කෙඳි වැනි රත්තරන් ගෙජ්ජි වැල් එල්ලා වටේට ආකාශ ගංගාව හා සමාන සුදු තිර ඇදලා මණ්ඩපය සරසා තිබුණි.

ii. සිංහාසනයට ඉහළින් මුතු ඇල්ලූ සුදු කුඩයකින් ද සිංහාසනය දෙපස (ඇඳි දෙක) රන් හා මැණික්වලින් අලංකාර කළ වැටකින් ද පූජාවට / උපහාරයට සුදුසු මල් විසුරුවා තිබීමෙන් ගාම්භීරත්වය මතු කර ඇත.

iii. සිංහාසනයේ ඇඳි දෙක රත්රන් හා මැණික්වලින් සමන්විත දිලිසෙන වැටවල් දෙකක් ද පූජාවට, උපහාරයට සුදුසු මල් ඉසිමින් විසිතුරු කර තිබීම.

iv. විදුලි කෙඳි වැනි රත්තරන් ගෙජ්ජි වැල් (ලකුණු $4 \times 4 = 16$යි)

ඊ) අවස්ථා සම්බන්ධය

i. බුද්ධ පුත්‍ර හිමියන් විසින් දඹදෙණි සාහිත්‍ය යුගයේ දී රචනා කරන ලද පූජාවලිය කෘතියේ ජීවක වෛද්‍යවරයාගේ කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. උදේනි නුවර චණ්ඩපජ්ජෝත රජුගේ පාණ්ඩු රෝගය සුව කරන අවස්ථාව හා සබැඳෙන එහි කාක නම් ධාවකයා ජීවක වෛද්‍යවරයා රැගෙන යාමට පැමිණි මොහොතේ ජීවිත කාක ධාවකයාට කලින් දුන් බෙහෙතක් ද නැවතත් බෙහෙතක් ද දුන් විට කාක ධාවකයා විසින් ජීවක වෛද්‍යවරයාට මෙසේ පවසන ලදී.

ii. ගම්පොළ යුගයේ වැඩ විසූ දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරකෘතියේ නන්දිවාණිජ කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. පටුන්ගම නන්දිය නම් වෙළෙන්දාගේ භාර්යාවගේ සිත ලබා ගැනීමේ අරමුණෙන් රජතුමාගේ සිව නම් අමාත්‍යවරයා නොයෙක් උත්සාහ කළත් ප්‍රතිඵලයක් නොවූ තැන නන්දි වෙළෙන්දා යකැදුරන් ලවා මැරවීමට සිව නම් අමාත්‍යයා විසින් යකැදුරන්ගෙන් මෙසේ අසන ලදී.

iii. දඹදෙණි යුගයේ ධර්මසේන නම හිමියන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. මට්ටකුණ්ඩලී මිය ගිය පසු අදින්නපුබ්බක බමුණා සොහොනට ගොස් හඬන අවස්ථාවේ දෙව්ලොව ගිය මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා ද සොහොනට පැමිණ දෙදෙනා අතර ඇති වූ කතා බහේ දී දිව්‍ය පුත්‍රයා විසින් අදින්නපුබ්බක බමුණාට ඔහුට පීඩනයට පත් කිරීමේ අරමුණෙන් මෙසේ ප්‍රකාශ කරන ලදී.

iv. ඒ. පී. ගුණරත්න මහතා විසින් අනුවර්තනය කරන ලද බැද්දේගම නවකතාවේ අටවෙනි පරිච්ඡේදයෙන් උපුටා ගන්නා ලද පාඨයකි. සිලිඳු ආරච්චිල හා ප්‍රනාන්දු මුදලාලි මරා කඹුරුපිටියේ රටේ මහත්තයාට ඒ බව කියා නැවත ඔහුට බැද්දේගමට නඩු විභාගයට රැගෙන ආ අවස්ථාවේ පුංචි මැණිකා පියාගෙන් තමා තනියම ගෙදර ජීවත් වන්නේ කෙදේ දැයි ඇසූ අවස්ථාවේ සිලිඳු විසින් පුංචි මැණිකාට මෙසේ ප්‍රකාශ කරන ලදී.

v. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද පේමතෝ ජායතී සොකෝ නාට්‍ය පිටපතෙහි තුන්වන අංකයෙන් උපුටා ගත් පාඨයකි. උද්දාල බමුණා අප දෙදෙනාට වියෝ වන්නට සිදු වේ දැයි ඇසූ පැනයට ස්වර්ණතිලකා විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී.

vi. ඒ. වී. සුරවීර මහතාගේ පැදි දියට බොරදිය කෙටිකතා සංග්‍රහයේ සඳහන් අකුරට යන වෙලාවේ කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. එම කෙටිකතාවේ සිරි හෙවත් කථකයා විසින් කරුණාපාලට උදව්වීමට රැගෙන ආ දූරිය (මැණිකා) ගේ පියා ඇයට ආපසු කැඳවාගෙන යාමට පැමිණි අවස්ථාවේ සිරි විසින් පුංචිරාලගෙන් බස් එකෙන් ද ආවේ යයි ඇසූ විට පුංචිරාළ විසින් සිරිට මෙසේ ප්‍රකාශ කරන ලදී.

vii. සයිමන් නවගත්තේගමගේ භාවනාව කෘතියේ ස්නේහය කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. පිංචි මහයියා සිල් සමාදන් වීමට යාම සඳහා තම ස්වාමියා වූ රංකිරා උන්දැගෙන් අවසර ලබා ගැනීමටත් රංකිරා උන්දැට බෝධි පූජාවක් තැබීමටත් පන්සලට යන බව හැඟවීමටත් පිංචි මහයියා විසින් රංකිරා උන්දැට මෙසේ ප්‍රකාශ කරන ලදී. (ලකුණු 3 × 4 =12යි)

## II - පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.1 2 | 1.2 5 | 1.3 3 | 1.4 4 | 1.5 1 | 1.6 5 |
| 1.7 2 | 1.8 1 | 1.9 4 | 1.10 3 | 1.11 4 | 1.12 3 |
| 1.13 2 | 1.14 1 | 1.15 5 | 1.16 3 | 1.17 1 | 1.18 5 |
| 1.19 2 | 1.20 4 | | | | |

(ලකුණු 1 × 20 =20යි)

02. අ) i. භාර දහසක්
ii. ඥාතිත්වය
iii. විසිහයකට
iv. සංස්කෘත, ග්‍රීක්, ලතින්, ස්පාඤ්ඤ, ජර්මන්, ඉංග්‍රීසි
v. අරාබි, හීබෲ
vi. ඉන්දු යුරෝපීය භාෂා වංශයට, ද්‍රවිඩ භාෂා වංශයට (ලකුණු 12යි)

ආ) සාරාංශය
* දැනුම් හැකියාව සහ ප්‍රවීණත්වය තීරණාත්මකයි.
* දැනුම ආර්ථිකයේ ප්‍රාථමික සම්පතක් වන අතර භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ද්විතීයික වේ.
* දැනුම සමාග්‍රහණය, නිර්මාණය, ප්‍රචලිත වීම හා ඵලදායීතාවය ආර්ථිකයේ ඵලදායීතාවය සහ සංවර්ධනය උදෙසා වැදගත්වේ.

* ජාත්‍යන්තරව නිර්මාණය වන දැනුම ග්‍රහණය කිරීම සමාග්‍රහණයයි.
* නව දැනුම නිෂ්පාදනය කිරීම නිර්මාණයයි.
* දැනුම සමාජය තුළ ව්‍යාප්ත කිරීම ප්‍රචලිත කිරීමයි.

ලකුණු ක්‍රමය

| | |
|---|---|
| කරුණු සඳහා | ලකුණු 09 යි |
| නියමිත වචන සංඛ්‍යාව | ලකුණු 02 යි |
| නිවැරදි අක්ෂර වින්‍යාසය | ලකුණු 02 යි |

03. වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුසුදුය.
- i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
- ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
- iii. කරුණුවල පැහැදිලි බව
- iv. නිවැරදි අක්ෂර වින්‍යාසය
- v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
- vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
- vii. කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම
- ix. විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු) (ලකුණු 25යි)

04. අ) i. තොටගමුවේ රාහුල් හිමියෝ සන්දේශ කාව්‍ය දෙකක් ලියූහ.
- ii. බස්රථ හා වෙනත් වාහන දහස් ගණනක් උදේ සවස කොළඹ නගරයට ඇතුළු වෙයි.
- iii. විශාඛා තොමෝ සන්සුන්ව ගමන් කරයි. (තුටු - කරයි)
- iv. කාමරයක මිල අධික නිසා ඔවුහු එහි නවාතැන් ගැනීමේ අදහස අත්හර හරිති.
- v. දූන් දූන් සමහරෙකු / සමහරකු නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනවශ්‍ය කොට සලකන්නා සේ පෙනේ.

ආ) i. නූතන නාට්‍ය විචාරකයන් විසින් ප්‍රේක්ෂකයෝ දැනුවත් කෙරෙති / කරනු ලැබෙති / ලැබෙත් / ලැබෙන්නෝ ය.
- ii. ඔවුන් විසින් ගුරුවරුන් හමු වී සිය අදහස් දක්වන ලදි / දක්වනු ලැබීය / දක්වනු ලැබිණ.
- iii. අධිකරණ වෛද්‍යවරයා විසින් හඳුනා නොගත් පුද්ගලයාගේ මරණය අධික රුධිර වහනය නිසා සිදුවූවක් බව ප්‍රකාශ කරන ලදී / කරනු ලැබී ය / කරනු ලැබුවේ ය / කෙරෙණි / කැරිණි
- iv. විදුහල්පතිනිය විසින් අ.පො.ස උසස් පෙළ විභාගයෙන් දිවයිනේ ප්‍රථම ස්ථානය ලබාගත් ශිෂ්‍යාව සාදරයෙන් පිළිගනු ලැබුවා ය / පිළිගන්නා ලද්දී ය.
- v. අධ්‍යාපන ඇමතිතුමා විසින් විෂය ප්‍රතිඵල ඉහළ නැංවූ ගුරුවරු ඇගයීමට ලක් කරන ලදහ / ලද්දෝය

ඉ) i. පඬිවරුන්ගේ මතය කුමක් වුවත් පුරාතන සිංහල කවීහු හැකි හැම විටම සංස්කෘත බලපෑමෙන් ඉවත්වන්නට බැලූහ.
- ii. බොහෝ සිංහල ගීත ගායකයෝ වාදකයෝ වෙති.
- iii. ළමයින් ගුරුවරුන්ට වෛර කරතියි'' මම නොසිතමි.
- iv. දරුවන් යහ මග යවන්නේ කෙසේ ද?
- v. සීගිරි චිත්‍ර පිළිබඳව නොයෙක් උගතුන් විවිධාකාරයේ අදහස් පළ කොට ඇත. (ලකුණු 5 × 3 =15යි)

05. i. (දියනෙත - අන්‍යාර්ථ සමාස, වත - කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, කිරණින් - කරණ විභක්ති)
- ii. (නැණැති - පූර්ව ස්වර ලෝප සන්ධි, දනන්හට - සම්ප්‍රදාන විභක්ති, ද - වාක්‍ය සම්බන්ධය හඟවන නිපාත)
- iii. (නිති - කාලාර්ථයේ නිපාත, සුපසන්න - අව්‍ය සමාස, මුවතඹර - උපමා විශේෂණ පූර්ව පද සමාස)
- iv. (කඩිති - ස්වල්ප අර්ථයෙහි යෙදෙන තද්ධිත, ම - අවධාරණාර්ථය හඟවන නිපාත රැඳුන - වර්තමාන කෘදන්ත)
- v. (ගැමි - එහි වූයේ යන අර්ථය දෙන තද්ධිත, ජනයාට - සම්ප්‍රදාන විභක්ති, ධර්මෝපදේශ - ස්වරාදේශ සන්ධි)

(ලකුණු 5 × 3 =15යි)

06. අ) i. භාෂාවත් ව්‍යාකරණයත් අතර ඇත්තේ අත්‍යන්ත සම්බන්ධතාවයකි.
- ii. දේශපාලන ස්ථාවරත්වය රටක සංවර්ධනය සඳහා බෙහෙවින් බලපාන සාධකයකි.
- iii. මධ්‍යම ප්‍රතිපදාව නූතන සමාජයේ ගැටලු විසඳා ගැනීමට අදාළ කර ගත හැකි බව බොහෝ දෙනාගේ මතයයි.
- iv. ජනකවියාගේ සානුකම්පිත දෘෂ්ටිය එක් ජන කොටසකට පමණක් සීමා වූවක් නොවේ.

v. දරිද්‍රතාව හා විදේශීය සංක්‍රමණය නම් ප්‍රපංච දෙක අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධතාවක් දක්වයි.

vi. මිනිසාගේ පරිකල්පන ශක්තිය දියුණුවත් ම ඔවුහු වනයේ අනිත් සතුන් අබිබවා යන්නට වූහ.

(ලකුණු 1/2 × 6 =03යි)

ආ) i. බහු + අර්ථ - බහ්වර්ථ

ii. නි + ඔද - නිරොද

iii. දඹු + කඩ - දංකඩ

iv. රත්මල් + ආන - රත්මලාන

v. බුදු + සරණ - බුත්සරණ

vi. ඔබින් + ඔබ (ලකුණු 1/2 × 6 =03යි)

ඇ) i. ඇසේ - ආධාර විභක්ති ඔබේ - සම්බන්ධ විභක්ති

ii. පැදුරෙන් - අවධි විභක්ති සියුමැලියෙ - ආලපන විභක්ති

iii. දෑසින් - කරණ විභක්ති දරුවෙක් - ප්‍රථමා විභක්ති (ලකුණු 1/2 × 6 =03යි)

ඈ) i. 'නැත උපාසකයෙනි, සිඟුවත් නිරන්තරව ම මෙසේ ම දන් ලැබෙති' යි තෙරුන්නාන්සේ කීහ.

ii. ''නීතියක් වශයෙන් ප්‍රධාන කොට වනයෙහි පවතින්නේ බිය ය. බඩගින්න හා පිපාසය ඊළඟට පැමිණේ.'' (3 වෙනි පිට)

iii. ''මානව වර්ගයාගේ අදහස් උදහස්, ශිල්ප විධි, චින්තනය හා චාරිත්‍ර වාරිත්‍ර යන සියල්ල අඩංගු සමස්තය, සංස්කෘතිය නම් වෙයි.'' (ලකුණු 1/2 x 6 =03 )

ඉ) i. ඔවුන් ලබන සතියේ ශ්‍රමදානයක් කරන බව සමිති සමාජිකයෝ පැවසූහ.

ii. පොත පත පරිශීලනය කිරීම පුරුද්දක් කර ගන්නා ලෙස සාහිත්‍ය උත්සවයට පැමිණි ලේඛකයා දරුවන්ගෙන් ඉල්ලා සිටියේ ය.

iii. හැම දෙමව්පියෝම දරුවන් දැඩි කරන්නෙ දුක් මහන්සි වී බව විදුහල්පතිතුමා ප්‍රකාශ කළේ ය.

(ලකුණු 1 × 3 =03යි)

07. i. අභිභවනය, තාක්ෂණය, නිර්මාණය, නිෂ්පාදනය, පෘථුලත්වය, මානව, වෛෂයික

ii. ඉස්පිල්ල, ඇලපිල්ල / කොම්බු දෙක, ඉස්පිල්ල / පා පිල්ල, කොම්බුව, ඇලපිල්ල හා දීර්ඝත්ව ලකුණ

iii. අදාළ උදාහරණවලට ලකුණු දෙන්න

iv. පෘථුලත්ව, ඉන්දියානු, වෛෂික පෘථුල +ත්ව ඉන්දියා + නු, විෂය + ඉක

v. අදාළ උදාහරණ සඳහා ලකුණු දෙන්න. (ලකුණු 3 × 5 =15යි)

(08) කෙටි සටහන් සඳහා අදාළ පරිදි ලකුණු දෙන්න. (ලකුණු 5 × 3 =15යි)